
# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## වර්ෂ අවසාන ඇගයීම - 2006
## ගණිතය

**7 ශ්‍රේණිය**

නම / අංකය :......................................................................................................කාලය : පැය 02 යි

**I** කොටස ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 බැගින් හිමිවේ.

(01)



(A) (B)

රූපයේ දක්වා ඇති (A) භාජනයේ චොක්ලට් 9 ක් ඇත. (B) භාජනයේ චොක්ලට් 12 ක් ඇත. භාජන දෙකෙහිම ඇති චොක්ලට් ගණන ලියන්න. ____________

එය ඔත්තේ සංඛ්‍යාවක් ද? ඉරට්ටේ සංඛ්‍යාවක් ද? ____________

(02) වාහනයක මිල රුපියල් 3 995 000 කි. එම අගය වචනයෙන් ලියන්න.

____________________________________________

(03) 2g , 225 mg , 2345 mg , 2.125 g ඉහත දී ඇති බර අවරෝහණ පිළිවෙළට සකස් කරන්න.


____________________________________________

(04) $\frac{1}{4}$ x 3 හි පිළිතුර දී ඇති රූපයේ නිරූපණය කර දක්වන්න. ____________

(05) රූපයේ දැක්වෙන වෘත්තයේ අරය 5cm වේ.

(i) PQRS සමචතුරස්‍රයේ පාදයක දිග සොයන්න. ____________

(ii) සමචතුරස්‍රයේ පරිමිතිය කීයද? ____________




(06) " > " හෝ " < " සංකේතය යොදා පහත දී ඇති භාග සම්බන්ධ කරන්න.


$\frac{2}{3}$ $\frac{1}{2}$ $\frac{3}{5}$

(07) ලණුවක දිග මීටර් 7 යි සෙන්ටි මීටර් 80 වේ. එයින් කපන ලද සෑම කෑල්ලකම දිග 60cmකි. කැපූ කෑබලි ගණන කීයද? ____________

(08) දී ඇති රූපයේ,


(i) ත්‍රිකෝණ සංඛ්‍යාව කීයද? ____________

(ii) මෙම රූපය තුළ දැකිය හැකි වෙනත් බහු අස්‍රයක් නම්කරන්න.



(09) හිස්තැන් පුරවන්න. $X^0$ යනුවෙන් දී ඇති කෝණයේ අගය


සෘජුකෝණ ____________(3 , 2) ට ____________(අඩු , වැඩි) වේ.




(10) සිසිල් බීම බෝතලයක 300ml අඩංගු වේ. එවැනි බෝතල් 5ක ඇති බීම ප්‍රමාණය ලීටර් වලින් දක්වන්න. ____________

(11) $\frac{70}{100}$ + 0.35 = ____________ මෙම හිස්තැන සඳහා සුදුසුම දශම අගය ලියන්න.


(12)




සංඛ්‍යා රේඛාවෙන් නිරූපණ අගය සෙවීමට හිස්තැන් පුරවන්න. 4 + ______ = ______

(13) මායා ළඟ රු. x ඇත. පෑනක් ගැනීමට රුපියල් 12 ක් වියදම් කළ පසු රුපියල් 18 ක් ඉතිරි විය. ඒ සඳහා සමීකරණයක් ලියන්න. ______________

(14) මෙම තල රූපයෙන් පාදයක දිග 2cm වන චතුස්තලයක් සාදාගත හැකි අන්දමේ පතරොමක් ඇඳ දක්වන්න.




(15) සංඛ්‍යා දෙකක මහාම පොදු සාධකය 12 වීමට තිබිය හැකි සංඛ්‍යා දෙකක් ලියන්න. ______________

(16) සුරේෂ් තම වාහනයෙන් පැය 3 කදී 150km ගමන් කර ඇත. ඔහුගේ වාහනයේ සාමාන්‍ය වේගය පැයට කිලෝමීටර් කීයද? ______________

(17) වෘන්ත පත්‍ර සටහනේ පංතියක සිසුන් ගණිතය විෂයයට ලැබූ ලකුණු කිහිපයක් දැක්වේ. එහි 25 ට වැඩි ලකුණු සියල්ල ලියන්න.


______________

| වෘන්ත | පත්‍ර |
|---|---|
| 0 | 8 9 |
| 2 | 1 4 5 |
| 3 | 0 2 3 6 7 |

(18) රූපයේ දැක්වෙන,

(i) සෘජු කෝණාස්‍රයේ වර්ගඵලය සොයන්න. ______________

(ii) ඉහත වර්ගඵලයට සමාන වර්ගඵලයක් ඇති සමචතුරස්‍රයේ පාදයක දිග සොයන්න. ______________




(19) $p = 3$ , $q = 2$ වන විට $2p^2q^3$ හි අගය සොයන්න.

______________

(20) {1 සිට 11 දක්වා ඉරට්ටේ සංඛ්‍යා} කුලකයේ අවයව

(i) සඟල වරහන් තුළ ලියන්න.

(ii) වෙන් රූපයකින් දක්වන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

## II - කොටස

**ඕනෑම ප්‍රශ්න 6 කට පිළිතුරු සපයන්න.**

(01) (අ) පහත දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණද, වැරදි නම් (X)ලකුණ ද ඉදිරියේ ඇති කොටුව තුළ සටහන් කරන්න.

(a) "ගණිත උපකරණ පෙට්ටිය තුල අඩංගු උපකරණ" කුලකයක් වේ. ☐

(b) "වටිනාකමින් අඩු කාසි" කුලකයක් වේ. ☐

(c) "පවුලේ සාමාජිකයින්" කුලකයක් නොවේ. ☐

(d) කුලකයක අවයව සඟල වරහන් තුල ලියා දැක්විය හැකිය. ☐ ල. 1 x 4 - 04

(ආ) {25 ට අඩු ත්‍රිකෝණ සංඛ්‍යා} කුලකයේ අවයව වෙන් රූප සටහනක දක්වන්න. ල. 06

(02) (i) අරය 4cm වන වෘත්තයක් අඳින්න. ල. 01

(ii) එහි කේන්ද්‍රය 'O' ලෙස නම් කරන්න. ල. 01


(iii) තිරස් විෂ්කම්භය ඇඳ AB ලෙස නම් කරන්න. ල. 02

(iv) $A\hat{O}C = 90^0$ වන ලෙස කෝණය ඇඳ 'O' සිට 3cm ක් දුරින් C ලකුණු කරන්න. ල. 02

(v) AC යාකර $O\hat{A}C$ මැන ලියන්න. ල. 01

(vi) AC දුර මැන ලියන්න. AOC ත්‍රිකෝණය පාද අනුව කුමන වර්ගයේ ත්‍රිකෝණයක්ද? ල. 01, 02

(03)




(i) (ii)

ඉහත (i) රූපයෙන් දැක්වෙන සමචතුරස්‍රාකාර ඉඩමේ වර්ගඵලය $100m^2$ වේ. (ii) රූපයෙන් දැක්වෙන සෘජුකෝණාස්‍රාකාර ඉඩමේ දිග එහි පළල මෙන් දෙගුණයකි. එම ඉඩමේ පළල සමචතුරස්‍රාකාර ඉඩමේ පැත්තක දිගට සමානය.

(i) සෘජුකෝණාස්‍රාකාර ඉඩමේ පළල සොයන්න. ල. 03

(ii) සෘජුකෝණාස්‍රාකාර ඉඩමේ දිග සොයන්න. ල. 03

(iii) සෘජුකෝණාස්‍රාකාර ඉඩමේ වර්ගඵලය සොයන්න. ල. 02

(iv) සෘජුකෝණාස්‍රාකාර ඉඩම සමචතුරස්‍රාකාර ඉඩමේ වර්ගඵලය මෙන් කී ගුණයක්ද? ල. 02

(04) ලුහිරු තම වැටුපෙන් $\frac{1}{3}$ ක් ගමන් වියදම් සඳහා ද, $\frac{1}{6}$ ක් ඇඳුම් සඳහා ද $\frac{1}{2}$ ක් ආහාර සඳහා ද වියදම් කරයි.

(i) වැටුපෙන් වැඩි මුදල් ප්‍රමාණයක් වියදම් කර ඇත්තේ කුමන කටයුත්ත සඳහා ද? ල. 02

(ii) පහත දැක්වෙන මිශ්‍ර සංඛ්‍යා විෂමභාග ලෙස ලියා දක්වන්න.


(a) $4\frac{2}{3}$ (b) $3\frac{7}{15}$ ල. 01, 01

(iii) පහත ගැටළුව ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා හිස්තැන් සම්පූර්ණ කරන්න.

$\frac{1}{4} \div 3 = \frac{1}{4} \times \frac{\square}{\square} = \frac{1 \times \square}{4 \times \square} = \frac{\square}{\square}$ ල. 06

(05) දී ඇති තොරතුරු සහ මිනුම් භාවිතා කර පහත රූප අඳින්න.


(i)




ල. 03

To download past papers visit
www.vajirapani.blogspot.com

(ii)




පරිමාණ රූපය

ල. 03

ඉහත II යටතේ ඔබ අඳින ලද පරිමාණ රූපයේ පරිමාණය 1cm කින් 2m කි.

(iii) සැබෑ රූපයේ දිග කීයද? ල. 02

සැබෑ රූපයේ පළල කීයද? ල. 02

(06) (i) එකක දිග 50cm ක් හා අනිකේ දිග 1m වූ පටි දෙකක දිගෙහි අනුපාතය සරල ආකාරයෙන් දක්වන්න. ල. 02


(ii) රු. 200 ක මුදලක් උපුල් හා කමල් අතර 3 : 7 අනුපාතයට බෙදන ලදි.

(අ) උපුල්ට ලැබුණු මුදල කීයද? ල. 04

(ආ) කමල්ට, උපුල්ට වඩා රුපියල් කීයක් ලැබුණේද? ල. 04

(07) (i) x - අක්ෂයත් y- අක්ෂයත් 0 සිට 8 දක්වා වූ කාටීසීය තලයක් අඳින්න. ල. 02

(ii) එහි පහත දැක්වෙන රූපය පිටපත් කර ගන්න. ල. 02




To download past papers visit
www.vajirapani.blogspot.com

(iii) තිත් ඉරෙන් දැක්වෙන රේඛාව සමමිතික අක්ෂය ලෙස ගෙන ඉහත රූපය සම්පූර්ණ කරන්න. ල. 03

(iv) P, Q, R, S ලක්ෂ්‍යවලට අදාල වන ලක්ෂ්‍යවල පටිපාටිගත යුගල ලියන්න. ල. 03

(08) (i) නිඛිල + යටතේ පිළියෙල කළ කොටුවක් පහත I රූපයේ දැක්වේ. එය නිරීක්ෂණය කරන්න. II රූපයේ දැක්වෙන කොටුව ඔබේ පිළිතුරු පත්‍රයේ ඇඳගන්න. එහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

| + | +3 | 0 | +8 |
|---|---|---|---|
| +3 | +6 | +3 | +11 |
| +5 | +8 | +5 | +13 |
| -3 | 0 | -3 | +5 |

I - රූපය

| + | −3 | +3 | +8 |
|---|---|---|---|
| +3 | | | |
| 0 | | | |
| −5 | | | |

II - රූපය

ල. 10